කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
(බාහිර) - 2008

සමාජීය විද්‍යා පීඨය

ජනසන්නිවේදනය - MACO –E2015

භාෂාව හා සන්නිවේදනය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

01. භාෂාව සහ සමාජය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි. භාෂාව, සමාජ සංසිද්ධියක් ලෙස ගෙන පැහැදිලි කරන්න.

02. භාෂාව සංස්කෘතියේ කැඩපතකි. විමසන්න.

03. ලේඛකයෝ විවිධ භාෂා ශෛලීන් කීරු ලිපිය සඳහා භාවිත කරති. නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

04. විද්‍යුත් මාධ්‍ය සඳහා භාෂාව භාවිතයේ දී දැකිය හැකි විශේෂතා මොනවාද? සාකච්ඡා කරන්න.

05. සංඥාර්ථවේදය, භාෂාව සහ සන්නිවේදනයේදී හඳුනා ගන්නේ කෙසේද? පැහැදිලි කරන්න.

06. නිර්මාණාත්මක සන්නිවේදනයේදී ජනවහර ඉතා ප්‍රබලව භාවිත වෙයි. නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

07. පහත සඳහන් ගීතය පිළිබඳ ඇගයීමක් කරන්න.

**<u>ගමේ යන සකිසඳට</u>**

රණවරා ගහේ මල් පිපෙන කාලෙට
සඳසරා, කුමරිය ඇවිත් කන්දට
අතවනා කියයි මට ගමට එන්නට
සකිසඳේ හැඩුම් මීස බැරිය සීපද

වැඩපලේ වහල උඩ අඬන කොවුලනී
මොකද මේ තොපට නැතුවාද බඩගිනී
නම කියා විහිළු කළ කුරුළු දරුවනී
මැළ වුනාම එරබදු මලෙත් නෑ පැණී

එනතුරා පැලට අවුරුද්ද දුක නැතී
මඟ බලාන දොරකඩ පුංචි දුව ඇතී
පඩි අරන් හෙට උදේ ගමට යන සකී
නුඹ අතේම මට මගේ කඳුළු යැව්වැකී

08. පහත මාතෘකා **<u>හතරක්</u>** සඳහා කෙටි සටහන් ලියන්න.

I. තිර රචනය
II. කතු වැකිය
III. ප්‍රාදේශීය උපභාෂා